**3 වන පිටුවෙන් (ආබාධිතයා සහ )**

සමාජයට මුදා නොහරින්නේ ලැජ්ජාව වසා ගැනීමට නොව, මුදා හැරීමෙන් පසු ඇතිවන බේදවාචකයන්ට මුහුණ දීමට නොහැකි නිසා බව අපිට පසක් වන්නේ දැන්ය.

උපතින්ම අතක් අහිමි වූ මාගේ මිතුරෙක් සිටී. ඔහු උපන් විටම පියා මවට පවසා ඇත්තේ කැලයට විසිකර හෝ ඔහුව මරා දමන ලෙසට. ඒ කාලයේ ආබාධිතයන් වෙනුවෙන් එහෙම සිතන මිනිසුන් කොට්ඨාශයක්ද සිටියේය. එහෙත් තම මව් එසේ නොකර කුඩා කාලයේ සිටම තමාව උස්මහත් කරමින් රැකබලාගත් අයුරු ඔහු මට පැවසුවේ බොහෝ දුකෙනි. ගෙයක් දොරක් හදාගෙන, රැකියාවක් කරමින් විවාහ දිවියට ඇතුලත් වූ ඔහු දරුවන්ද සමාජයට ලබා දුන්නේය. එසේම ඔහු දක්‍ෂ චිත්‍ර ශිල්පියෙක්ද විය. කුඩා කාලයේදීම මරා දැම්මා නම් තනි අතින් චිත්‍ර අඳින එම සිත්තරා අපිට මුණ ගැහෙන්නේද නැත. ලලිත් කොතලාවල මහතා විසින් ඔහුට කෘතිම අතක් බද්ද කරනතුරු ඔහු තනි අතින් සියලු වැඩ කටයුතු කරගෙන ගියේය.

වැඩිහිටයන්ගේ පැත්තෙන්ද එසේමය. කෙතරම් බණ දහමින් පෝෂිත වුවත් වැඩිහිටයන්ට සලකන්නන්ගෙප්‍රමාණයද සීඝ්‍රයෙන් පිරිහෙමින් පවතී. වැඩිහිටියන් ගෑස් ලාම්පුවක මැන්ටලයක් ගානට පත්කරගෙන ඇති අපේ තරුණ පරම්පරාවේ ප්‍රමාණයද සාපේක්‍ෂව ඉහළ නගින අතර, ඔවුන් කිසිදිනෙකවත් වැඩිහිටයන් නොවන බව සිතීමෙන්ද පිරිහෙමින් පවතින ප්‍රමාණය ඉහලය.

උප්පත්තියෙන් හෝ වේවා දිවිමගේ අතරමගකදී හෝ වේවා කවුරුන් හෝ අබාධිතයන් වේ නම්, අපිට මෙන්ම ඔවුන්ටද සම්පත් ලබාදෙමින්, ඔවුන්ව පුනරුත්තාපනය කිරීම අප සැවොමගේ යුතුකමයි. එහෙත් "සසර වසන තුරු නිවන් දකින තුරු පින් කෙත හෙල රන් දෙරණේ, යලි උපදින්නට හේතු වාසනා වේවා" ගීය කියන වැඩිමහල් අමරදේව මහතා පවා බසයක ගමන් කලහොත් තල්ලු කර බිමට දමන තරුණ පරම්පරාවක් බිහිවී ඇති රටක, නැවත උපදින්නට ප්‍රාර්ථනා කරන්නේ කෙසේද ?

අපේ රටේ සිටි විශාල ධන කුවේරයෙකුගේ පුතෙකු කහ ඉර මත ගිය අන්ධ පියෙක් තම සුඛෝපභෝගී රථයෙන් බීමත්ව ගොස් හප්පා මරා දැමුවේ කහ ඉරේ අයිතිකරු තමා ලෙස සිතාගෙනයි. ඉතාමත් දුගී එම පවුල මුණග උසුණු ඔහුගේ පියා මුදල් දී එය වෙනතකට හරවන්න තැත් කලද, දුප්පත් වුවත් මුදල් භාර නොගත් එම දුගී මිනිසාගේ බිරිඳ අඬමින් ඉල්ලා සිටියේ සල්ලි වෙනුවට තම සැමියා ගෙනත් දෙන ලෙසය. පසුව ලංකාවේ මහ පරිමාණයේ අධිනීතිඥයෙකු ඔහුගේ පුතුව බේරාගත්තේ අන්ධ මිනිසා කහ ඉරේ නො ගොස් පාරට පැන දිවි නසා ගත් බව ඔප්පු කරමිනි.

අද සිරි ලංකාවේ අබාධිතයන් හා වැඩිහිටයන් වැටී ඇති තත්වය එයයි. ජීවිතයේ තම අවසාන කාලය අමන බස් කොන්දොස්තරවරුන්ගේ කට ගැස්මට ලබාදෙන අබාධිතයන් වැඩිහිටයන් තව කොතෙක් ඇද්ද ? මොවුන් වෙනුවෙන් සැබෑ හඬක් නගන්නට කිසිවෙකුත් නැතිද ? මේ කාරණය සලකා බැලූ කල ජාතක කතා සංග්‍රහයේ තත්තිර ජාකතකයෙන් අපිට වැදගත් පණිවිඩයක් ලබාදෙයි. ඒ පිදිය යුත්තන්ට, වැඩිහිටි අයට ප්‍රමුඛතාවය දී ගරු කිරීම සමාජයක් යහපත් කිරීමට ප්‍රබල සාධකයක් බවට. නමුත් වැඩිහිටයන්ට පහර දෙන, ඔවුන් මරා දමන මෙවැනි සමාජයක් යහපත් සමාජයක් බවට පත් කරගන්නේ කෙසේද ? එය කිසි දිනෙක වැඩිහිටියෙක් නොවන බව සිතන තරුණ සමාජයට එල්ලවූ මූලික අභියෝගයක් බවට පත්ව ඇත.

**8 වන පිටුවෙන් (දෙවියන් ප්‍රශ්නයක්ද ? )**

නොවන, කිසිවකුට නපුරක් නොපතන ආදරය ම නොවේ ද?

අද ලෝකය කුහකත්වයෙන් පිරී ඇත. ආගම මූලධර්මවාදීන්ගේ ආයුධ බවට පත්ව ඇත. සියළුම ආගම්වල හරය අමතක කොට චාරිත්‍ර වාරිත්‍ර වලට මුල්තැන දී ඒවා ජීවිකාවන් බවට පත්කරගෙන ඇත. ආගමක් ඇදහීම යනු පල්ලියේ, පන්සලේ, කෝවිලේ සිදුවන වතාවත් වලට සහභාගි වීම ම නොවේ. ඒවා ඇත්තේ ධර්මය මිනිසුන්ට කියාදීමටය. ධර්මය ඇදහීම යනු ඒ තුළ ජීවත් වීමයි. ක්‍රිස්තුස්වහන්සේ ක්‍රිස්තියානුවෙක් ද? බුදුන්වහන්සේ බෞද්ධයෙක් ද? මුහම්මද්තුමා මුස්ලිම්වරයෙක් ද? නැත, එහෙත් අපි බෙදී සිටිමු. අපි අපේ ගොඩට පමණක් යහපත කරමු. කුහක සිත් ඇතුව ජීවත් වෙමු. ඇමරිකාවේ වර්ජිනියා සරසවියේ සිසුන් තිස් දෙදෙනෙක් ඝාතනය වෙද්දී එය ඕස්ට්‍රේලියානු පුවත්පත් වල ප්‍රධාන ශීර්ෂ පාඨය වන්නේත්, ඊට දින තුනකට පසු ඉරාකයේ බෝම්බයකින් සිවිල් වැසියන් සිය ගණනක් මියයද් දී එය සාමාන්‍ය ප්‍රවෘත්තියක්වත් නොවන්නේත් මේ කුහකත්වය නිසාය. බුරුමයේ, ටිබෙටයේ කැරලි කෝලහාල වලින් විපතට පත්වූවන් වෙනුවෙන් උණුවන ශ්‍රී ලාංකිකයින්ගේ හදවත් ඇමරිකාවේ, ඉරාකයේ විපතට පත්වූවන් වෙනුවෙන් උණුනොවන්නේත් මේ කුහකත්වය නිසාය. කුරුස යුද්ධ ඇතිවූයේත්, ඇෆ්ග නිස්ථානයේ දී බුදු පිළිම කඩා බිඳ දැමුවේත්, ඉන්දියාවේ දී ආගමික ස්ථාන ගිනිබත් වූයේත්, ශ්‍රී ලාංකාවේ දී පූජකවරුන් පන්සල් තුළට ඇදගෙන ගොස් පහර දුන්නේත් මේ කුහකත්වය නිසාය. අන් රටවල තම දහම පැතිරෙද්දී උදම් අනන්නේත්, තම රටේ අන් දහමක් පැතිරෙද්දී ප්‍රකෝපවන්නේත් මේ කුහකත්වය නිසාය.

ආගම් ලොවට දයාද කළ ශාස්තෘන්වහන්සේලා අද සිටියා නම් කුමක් කරනු ඇත් ද? අප්‍රිකාවේ දිළිඳුන් සාගතයෙන් මියයද්දී ඕස්ට්‍රේලියාවේ මන්දිර වැනි නිවාස තුළ රසමසවුළු බුදිමින් ඉන්නට යැයි ක්‍රිස්තුස්වහන්සේ පවසනු ඇත් ද? සතුරු ජාතිය සමූලඝාතනය කර හෝ මව්බිම රැකගත යුතුයැයි බුදුන්වහන්සේ පවසනු ඇත් ද? ක්‍රිස්තුස්වහන්සේත්, බුදුන්වහන්සේත්, මුහම්මද්තුමාත් කඳවුරු බැඳගෙන සිය පිරිස වැඩිකරගැනුමට සටන් වදිනු ඇත් ද? මූලධර්මවාදීන්ට ද, ආගම් නොඅදහන්නන්ට ද, ආගම් වලට පහර දෙන්නන්ට ද අමතක වී ඇති හරය මෙය වේ.

තමන්ගේ ආගම පමණක් සත්‍යයැයි කීමට කිසිවකුට නුපුළුවන. අපි සැවොම පෘථ-ග්ජනයෝ වෙමු. ක්‍රිස්තුස්වහන්සේගෙන් පසුව ස්වර්ගය දුටු කෙනෙක්වත්, ගෞතම බුදුන්ගෙ න් පසු නිර්වානයට ළඟා වූ කෙනෙක්වත්, මුහම්මද්තුමාගෙන් පසු දෙවියන් හමුවූ කෙනෙක්වත් අප අතර නැත. අප සැවොම කරනුයේ ශාස්තෘන්වහන්සේලා එළි පෙහෙළි කළ මාර්ගයේ යෑම පමණකි. ධර්මය නිසි ලෙස පිළිපදිමින් මාර්ගයේ ගමන් කරන විට එම ඉගැන්වීම් සත්‍ය බව කෙමෙන් අවබෝධ කරගත හැකි වේ. එහෙත් මුළුමනින් ම ධර්මය අවබෝධ කරගෙන 'සත්‍ය නම් මෙයමැ'යි පැවසීමට තරම් කෙනෙකු අද අප අතර නැත.

එමනිසා වර්තමානයේ යුග මෙහෙවර විය යුත්තේ ආගම් වලට පහර දී හෑල්ලුවට ලක්කිරීම නොව ඒවායේ ඇති පුහු ආටෝප ඉවත්කර සැබෑ දහම එළියට ගැනීමයි. මේ ලෝකය සුව කළ යුතුව ඇත. ඒ සඳහා ඇති එකම සහ හොඳම ඖෂධය ආදරය වේ. ආදරය මුදහැරීමට ආගම ප්‍රබල මාධ්‍යයක් කරගත හැකිය. එහි වටිනාකම හඳුනාගන්න. අපට අවශ්‍යව ඇත්තේ හුදෙක් ප්‍රඥවන්තයින් පමණක් නොව දයාවෙන් පිරුණු මිනිසුන් ය.

